# සේනාසනක්ඛන්ධකයේ පැනෙන මානව සම්පත් කළමනාකරණය

ගාල්ලේ ධම්මින්ද හිමි

සහාය කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය
dhammigalle@gmail.com

## හැඳින්වීම

'සෙනසුන' (සෙනාසනං) වූ කලී භික්ෂු සංස්ථාවේ ක්‍රමික විකාශනයේ එක් ප්‍රතිඵලයකි. මුල් කාලීන භික්ෂූහු රුක් මුල්, වනපෙත් හා ශූන්‍යාගාර ආදිය ඇසුරු කරමින් වාසය කළහ. භික්ෂූන් වහන්සේගේ විවිධ අවශ්‍යතා කරණකොටගෙන, සෙනසුන් නිර්මාණය කිරීම ආරම්භ විය. ගෘහනිර්මාණ කලාවේ අපූර්ව සොයා ගැනීමක් වන සෙනසුන (Dwelling) හා තදනුබද්ධ මානව සම්පත් කළමනාකරණය මෙන් ම ආවාස කළමනාකරණය (Human Resource Management & Residential Management) යන ප්‍රස්තුත කෙරෙහි අප අවධානය යොමු වේ.

## පර්යේෂණ ගැටලුව

පර්යේෂණ පත්‍රිකාවේ ගැටලුව ලෙස හිඳුනාගනු ලබන්නේ සේනාසනක්ඛන්ධකයේ පැනෙන මානව සම්පත් කළමනාකරණයට අදාළ න්‍යාය හා භාවිතයන් කෙතෙක් දුරට නූතන ආරාමීය සංස්ථාව විෂයෙහි භාවිත කළ හැකිදැයි යන්න ය.

## අරමුණු

මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වඩා ප්‍රජාතන්ත්‍රීය වූත් නිරවද්‍ය වූත් විස්තරයක් විනය පිටකයේ චුල්ලවග්ගපාළියට අයත් සේනාසනක්ඛන්ධකය ඇසුරු කරගෙන අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධානතම අභිප්‍රායයි. පර්යේෂණ පත්‍රිකාවේ එළඹුම් (Findings) උපයෝගී කොටගෙන වඩාත් සාර්ථක ආරාමීය දිවියකට අවැසි මානව සම්පත් හා ඒවායේ කළමනාකාරීත්වයේ අදාළත්වය පිළිබිඳව ද මෙහි දී සාකච්ඡා කෙරේ.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය මුඛ්‍ය වශයෙන් චුල්ලවග්ගපාළියේ සවන ඛන්ධකය වන සේනාසනක්ඛන්ධකය ඇසුරු කෙරේ. තදනන්තරව සමන්තපාසාදිකාව ද තත් මාතෘකාවට සමීපස්ථ ද්විතීයික මූලාශ්‍රයන් සහ මානව සම්පත් කළමනාකරණ විෂයට අදාළ මූලාශ්‍රයන් ද භාවිතයට ගැනේ.

## සාකච්ඡාව

සේනාසන පැනවීමට ප්‍රථම රුක්මුල්, පර්වත, කඳුරැලි, ගල් ලෙන්, සොහොන්, වනපෙත්, එළිමහන් හා පිදුරු ගොඩවල් යනාදී ස්ථාන ඇසුරු කරමින් භික්ෂූහු කල් ගෙවූහ. රජගහනුවර වේළුවනාරාමයේ දී සෙනසුන් පැනවීම (සේනාසනං පඤ්ඤත්තං) සිදු විය. භික්ෂූන් වහන්සේගේ සාධාරණ අවශ්‍යතාවන් සැලකිල්ලට ගත් බුදුහු සෙනසුන් පිළිගැනීම අනුමත කළහ. 'අනුජානාමි භික්ඛවේ පඤ්ච ලේනානි විහාරං අඩ්ඪයෝගං පාසාදං හම්මියං ගුහාති' ( *සේනාසනඛන්ධක, බු. ජ. ත්‍රි. ග්‍ර, පිට. 128.)* (මහණෙනි, විහාරය ද ගුරුළු පියාපත් වැනි සෙවණ ඇති ගෙය ද දික් පහය ද සඳලු සහිත ගෙය ද ගුහාව ද යන ලෙන් පස අනුදනිමි).

බෞද්ධ භික්ෂු සංස්ථාව ආරාමීය වශයෙන් සංවිධිත ව ආරම්භ වන්නේ මෙම වකවානුවේදී ය. එම අනුමැතියෙන් පසු එක් ගෘහපතියෙක් එදින ම විහාර සැටක් තනවා

සිව්දිග වැසි භික්ෂු සංඝයාට පූජා කළේ ය. විහාර පූජාවත් සමග ම පැන නැගුණු විවිධ මානව අවශ්‍යතා තාර්කික මුහුණුවරකින් ඉදිරිපත් කිරීම මින් ඉදිරියට දක්නට ලැබෙයිග

ගිහියන් විසින් පූජා කළ විහාර ආරමවල දොරවල් නොමැතිවීමෙන් භික්ෂූහු ගෝනුසු පත්තෑ ආදී සර්පයන්ගෙන් පීඩා වින්දාහ. එබැවින් දොර බා පිළිගැනීම අනුදැන වදාරන ලදී. ආරාමයක අත්‍යවශ්‍ය අංගෝපාංග එකින් එක සකස්වන්නේ ඉනික්බිතිව ය. භික්ෂු සංඝයාගේ ක්‍රමික වර්ධනයත් සමග ආරාම සංස්ථාවල ඉඩ පහසුකම් හි සීමාවන් ද නිර්ණය වන්නේ ප්‍රායෝගිකව ය.

ආරාම සංස්ථාව තුළ පනවනු ලබන පළමුවන ඓතිහාසික ධුරය ලෙස සටහන් වන්නේ සෙනසුන් ගන්වන්නාගේ (සේනාසන ගාහාපක) තනතුර ය. තනතුරු ලබාදීමේ දී ශාසන චර්යාව තුළ අතිශය සාධාරණ මිනුම් දඬු පාවිච්චි කර ඇත. සාරිපුත්ත, මොග්ගල්ලාන වැනි උතුමන්ට අග්‍රශ්‍රාවක තනතුරු ලැබුණේ ද උපාලි කරණවැමියාට විනයධාරී තනතුර ලැබුණේ ද මුහුණ බැලීම් හෝ හිතමිත්‍රකම් නිසා නොවේ. එහි දැක්වෙන ආකාරයට සෙනසුන් ගන්වන්නෙකු මෙම පරිසාධන මිට්ටමේ සිටිය යුතු ය (,*.යෝන ඡන්දාගතිං ගච්ඡෙය්‍ය, න දෝසාගතිං ගච්ඡෙය්‍ය, න භයාගතිං ගච්ඡෙය්‍ය, න මෝහාගතිං ගච්ඡෙය්‍ය, ගහිතාගහිතඤ්ච ජානෙය්‍ය, එම, පිට 190).*

සේනාසනක්ඛන්ධකයේ එන තවත් එක් පරිපාලනමය එළඹුමක් නම් සාංඝික දේපල නොබෙදීමේ ක්‍රමය යි. එය භෞතික දේපල කළමනාකරණය යි.

1. ආරාමය හා ආරාම වත්ත නොබෙදිය යුතු ය

2. විහාරය හා විහාර වත්ත නොබෙදිය යුතු ය

3. ඇඳ, පුටු, බිසි, කොට්ට යනාදිය නොබෙදිය යුතු ය

4. හැලි, වළං ඇඳ, උදලු, සයනය යනාදී අත්‍යවශ්‍ය බඩු නොබෙදිය යුතු ය

5. තණ, මැටි, ලී බඩු යනාදිය නොබෙදිය යුතු ය

සේනාසනක්ඛන්ධකයේ පැනෙන අනෙක් තනතුර වන්නේ භාණ්ඩාගාරික (භණ්ඩාගාරිකං) තනතුර යි. ඥත්තියක් ලෙස පනවා වදාරන භාණ්ඩාගාරික ධුරය ආරාමීය සංස්ථාවේ බහුතර මනාපය මත බහුතර සුබ විහරණය උදෙසා තෝරා ගනු ලබන නිලයකි.

ආරාමය වූ කලී සංවිධිත සංස්ථාවකි. පැවිදි සමාජ සංස්ථාව තුළ මුල් පුටුව හිමිවන්නේ සඟමහලු ක්‍රමයකට ය. (The Order of Seniority). එහි දී නායක ස්ථවිර ප්‍රධානත්වය උසුලන අතර උන්වහන්සේ අනුව යමින් එකී සංස්ථාව ඉදිරි අරමුණු කරා ගමන් කරයි. 'භාණ්ඩාගාරික' වැනි තනතුරක් ලැබීමට නම් හුදෙක් වැඩිහිටි බව ඉක්මවා යන විශ්වසනීයත්වයක් ඔහු තුළ පැවතීම අනිවාර්ය ගුණාංගයකි. තනතුරු පිරිනැමීමේ දී වදාළ පඤ්ච ගුණාංග වඩාත් තහවුරු විය යුතු නිලයකි, භාණ්ඩාගාරික ධුරය. එවැනි නිලයක් දැරීමට නම් සංඝ සම්මුතිය අනිවාර්ය වේ.

සේනාසනඛන්ධකයේ එන මීළඟ තනතුර බිහි වන්නේ භෞතික සම්පත්වල සුරක්ෂිතභාවය උදෙසා ය. වරෙක බුදුරදුන් වෙත එළඹි භික්ෂූහු, 'සිවුරු පිළිගන්නෙකුගේ' අවශ්‍යතාව සැල කළහ. බුදුහු, සංඝ සම්මතයට අනුව යමින් සිවුරු පිළිගන්නෙකුගේ ධුරයක් පිහිටුවා වදාළහ. පිළිගත් සිවුරු බෙදාහැරීම සඳහා ම තවත් නිලයක් පිහිටු විය. නූතන පරිපාලන ව්‍යූහය සඳහා මෙම බල තුලනය මගින් ලැබෙන්නේ කදිම උදාහරණයකි. බොහෝ ආයතන 'කාර්‍ය්‍ය සාධනයක්' නොපෙන්වන්නේ මානව සම්පත් නිසි ලෙස භාවිත නොකෙරෙන නිසාවෙනි. සිවුරු දරන්නා ම (චීවරපටිග්ගාහකෝ) සිවුරු බෙදන්නට යෑම ගැටුම් රාශියකට මුල පිරීමකි. එනිසා ම තවත් එක් අයෙකු එම කාර්ය සඳහා පත්කිරීම ඥානාන්විත ක්‍රියාවකි. සිවුරු ඇති නැති භික්ෂූන් පිළිබඳ අවබෝධයක් ඇත්තේ ඔහුට ය. තමා ලබන ප්‍රත්‍ය පිළිබඳ පෞද්ගලික අයිතියක් භික්ෂුවට නොමැත. සාංඝික පරිභෝජනයේ විශේෂත්වය එය යි. සාධාරණ පරිභෝජනයක් සඳහා වූ ආරාමීය සංස්ථාගත චීවර බෙදන්නෙකුගේ (චීවරභාජකෝ) අවශ්‍යතාව මතුවන්නේ මෙම තත්ත්වය තුළ ය.

සේනාසන හා චීවර ප්‍රත්‍ය පහසුකමින් අනතුරුව පිණ්ඩපාතය හා ගිලානප්‍රත්‍ය පිළිබඳ නිවැරදි පරිපාලන අවශ්‍යතා පැනෙන්නට විය. ප්‍රත්‍ය ග්‍රාහකයෙකු සිටි පමණින් ලැබෙන දෑ සාධාරණව බෙදී

යන්නේ නැත. සංඝ සම්මතයෙන් කැඳ, බත් ආදිය නිසි අයුරින් බෙදා දීමට කැඳ බෙදන්නෙකු (යාගුභාජකෝ) බුදුරදුන් විසින් පත් කරනු ලැබීය. මෙතැන් සිට පිළිවෙළින් එළවැල බෙදන්නෙකු, (ඵලභාජකො) රස කැවිලි බෙදන්නෙකු, (ඛජ්ජභාජකෝ) අවශේෂ පිරිකර ලබා දෙන්නෙකු (අප්පමත්තක විස්සජ්ජකෝ) යනාදී තනතුරු කිහිපයක් ම සංඝ සම්මුතියෙන් පත්කරනු ලැබී ය. මෙහි අගට සඳහන් කළ අප්පමත්තක විස්සජ්ජක භික්ෂුවගේ තනතුරට අදාළ කාර්යයන් රාශියක් ම සේනාසනබන්ධකයේ ප්‍රකාශිත ය.

1 එක් ඉදිකටුවක් (සූචි) නිකුත් කිරීම

2 එක් පිහියක් (සත්ථකං) නිකුත් කිරීම

3 එක් වහන් සිගලක් නිකුත් කිරීම (උපාහන)

4 එක් කබානක් නිකුත් කිරීම (කායබන්ධනං)

5 එක් අංසබන්ධකයක් නිකුත් කිරීම

6 එක් පෙරහනක් (පරිස්සාවනං) නිකුත් කිරීම

7 එක් ඩබරක් (ධම්මකරකො) නිකුත් කිරීම

8 එක් කුසියක් (කුසි) නිකුත් කිරීම

9 එක් ලුහුඬු නුවාපතක් (අඩ්ඪකුසි) නිකුත් කිරීම

10 එක් පස්කඩ සිවුරෙහි මහා මණ්ඩලයක් (මණ්ඩලං) නිකුත් කිරීම

11 එක් නුවාවක් (අනුවාතෝ) නිකුත් කිරීම

12 එක් ඇතුළු නුවාවක් (පරිභණ්ඩං) නිකුත් කිරීම

දෛනික භෞතික අවශ්‍යතා පිළිබඳ සොයා බලන අප්පමත්තක විස්සජ්ජක නිලධාරී තැන, භික්ෂූන් සඳහා අවශ්‍ය කරන ගිතෙල්, තල තෙල්, මී, සකුරු ආදී අත්‍යවශ්‍ය දෑ පිළිබඳව කටයුතු කරන නිසි බලධාරියා ද වන්නේ ය. මෙහි ඇති සුවිශේෂීතාව නම් උක්ත ද්‍රව්‍ය අවශ්‍ය වුවහොත් දෙවනවර ද ලබාදීමට තරම් මෙම නිලධාරියා කාරුණික වීම ය.

බෞද්ධ ආරාම පාලනය තුළ දිස්වෙන තවත් එක් සුවිශේෂී තනතුරක් මීළිගට අපට හමු වේ. එනම් කාර්යාකාර්යයන්හි යොදවන්නෙකුගේ (ආරාමිකපේසකො) තනතුර යි. නූතන මානව සම්පත් කළමනාකරණ (Human Resource Management) විෂය තුළ ද අතිශය කැපී පෙනෙන භූමිකාවක් මොහුට හිමිවන අතර බොහෝ ආයතනවල සාර්ථකත්වය අසාර්ථකත්වය යන සාධකය රඳා පවතින්නේ මානව සම්පත් කළමනාකරුගේ (Human Resource Manager) හැකියාව, නොහැකියාව මත ය.

සේනාසනක්ඛන්ධකයට අනුව සාමණේර භික්ෂූන් පිළිබඳ සොයා බැලීමට සාමණේර ප්‍රේෂකයෙකු ද (සාමණේරපේසකෝ) සංඝ සම්මතයෙන් පත් කරගනියි. ඔහු තමා හා බද්ධව පවතින වගකීම් අතුරින් පිරිස මෙහෙයවීම භාරව සිටින නිලධරියා ය. ඕනෑම ආයතනයක මෙහෙයවීමක් නැතිව සිදුවන කාර්යයක් නොමැති තරම් ය. එය භික්ෂු සංස්ථාවට ද පොදු වූවකි (*ආරාමිකා අපේසියමානා කම්මං න කරොන්ති, එම, පිට, 234).*

## නිගමනය

මේ ආකාරයට උක්ත කරුණු සමෝධානය කිරීමෙන් පැහැදිලි වන්නේ ආරාමික සංස්ථාවක් තුළ පවතින අතිශය සාධාරණ වූ ද නිරවද්‍ය වූ ද ක්‍රමවත් පරිපාලන ව්‍යූහයක් පවතින බවයි. ඕනෑම සංස්ථාවක් තුළ භෞතික සම්පත් අභිබවා පවතින්නේ මෙන්ම පැවතිය යුත්තේ ද මානව සම්පතයි. ඒ පිළිබඳව ක්‍රමානුකූලව හා වඩා සාර්ථකව සිදු කරන කළමනාකරණය මානව සම්පත් කළමනාකරණය ලෙස හැඳින්වේ. චුල්ලවග්ගපාළියේ සංගෘහිත බන්ධක දොළහ අතුරින් සයවන බන්ධකය ලෙස සේනාසනක්ඛන්ධකයේ ප්‍රකාශිත මානව සම්පත් කළමනාකරණය අද්‍යතන සමාජ සංස්ථාවන් සඳහා කදිම මඟ පෙන්වීමකි. තනතුරු තානාන්තර නිසි ලෙස බෙදා තිබීමත් ඒවා අතර පවතින අන්තර් සුසංයෝගය තහවුරු කිරීමත් සාර්ථක පරිපාලන ව්‍යූහයක අත්‍යවශ්‍ය අංගයක් බව උක්ත කාරණා මගින් සාධනය කළ හැකි ය.

### ආශ්‍රේය ග්‍රන්ථ

සේනාසනක්ඛන්ධක, (චුල්ලවග්ගපාළි ෂෂ), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, 1983.

විසුද්ධිමග්ග ටීකා, මොරොන්තුඩුවේ ධම්මානන්ද සංස්කරණය, මහාබෝධි, 1944.

Mahâ-vagga, Vol. III, PTS, London, 1956.

Dutt, Sukumar. (1962) Early Buddhist Monarchism, Delhi, Munshiram.